**පිටබැද්දර ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පසුගිය හා සමාලෝචිත වර්ෂයේ සභාව සතු දේපළ සංවර්ධනය කිරීම සඳහා දරන ලද රු.4,441,297 වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 2,150,000 කින් කර්මාන්ත ණයගැතියන් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.806,247 ක් වූ විවිධ වියදම් සඳහා විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | ස්ථාවර වත්කම් ස්වරූපයේ නොවන රු.190,079 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අයිතම 209 ක් දේපළ පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | ඉකුත් වර්ෂවල හා සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමි ශේෂය රු.8,416,405 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

#### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් එකතුව රු. 17,130,589 ක් වූ ගිණුම් විෂයයන් 7 කට අදාළ ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු. 575,657 ක වෙනසක් විය. | 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

#### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන යනාදී තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 1,335,762 ක් වූ ගිණුම් විෂයන් 06 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | උපලේඛන නොපවතින බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

### 1.7 අනුකූල නොවීම

#### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | රු. 698,124 ක් වූ කල් ඉකුත් වූ විවිධ තැන්පතු, ටෙන්ඩර් තැන්පතු හා තෙමස් ඇප තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.19,640,754 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,339,119 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,687,000 | 1,500,829 | 1,700,085 | 1,700,329 | 1,640,000 | 2,462,123 | 1,413,173 | 1,899,585 |
| කුලී | 23,053,480 | 18,802,283 | 18,542,216 | 2,708,797 | 5,295,000 | 3,051,965 | 2,693,584 | 2,448,730 |
| බලපත්‍ර ගාස්තු | 1,155,100 | 1,525,768 | 1,525,768 | 71,522 | 860,100 | 720,863 | 719,863 | 71,522 |
| වෙනත් ආදායම් | 4,246,500 | 1,318,150 | 1,480,786 | 257,006 | 2,722,000 | 435,747 | 1,107,262 | 419,642 |
| එකතුව | 30,142,080 | 23,147,030 | 23,248,855 | 4,737,654 | 10,517,100 | 6,670,748 | 5,933,882 | 4,839,479 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ අදායම් රැස් කිරීමේ කාර්යයසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වන වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන 2021 ජනවාරි 22 දිනැති අංක 2212 ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර වරිපනම් බදු අය කිරීම සඳහා 2021 අප්‍රේල් 12 දින සභා සම්මත වී තිබුණි. එහෙත් විගණිත දිනය වූ 2023 පෙබරවාරි 09 දින වන විටත් වරිපනම් දේපළ තක්සේරු කර වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණය අවසන් වූ පසු තක්සේරු කටයුතු සිදු කරන බව. | කඩිනමින් වරිපනම් බදු අය කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ අක්කර බදු ශේෂය රු.318,851 ක් වූ අතර වර්ෂය අවසානයට එය රු.327,982 ක් විය. | හිඟ මුදල් අය කර ගැනීම සඳහා කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සභාව සතුව පවතින කඩ කාමර 120 ක් බදු දී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් බදුකරුවන් 66 දෙනෙකුගෙන් රු.2,230,472 ක කඩ කාමර කුලී අයවීමට තිබූ අතර ඉන් රු.857,230 ක ශේෂවල හිඟ කාලසීමාව වසර 03 ක් ඉක්මවා තිබුණි. | අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දින වන විට සභාව සතු කඩ කාමර 60 කට අදාලව කඩ බදු ගිවිසුම් යාවත්කාලීන කර නොතිබුණි. | කඩ කාමර ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | ගිවිසුම් ගතවීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට උසාවි දඩ රු.450,000 ක් හා මුද්දර ගාස්තු රු.12,173,919 ක් අය විය යුතුව තිබුණි. | අය කර ගැනීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඊ) | ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි එක්තරා හෝටලයකින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව ගාස්තු අය කර නොතිබුණි. | දැනුවත් කිරීමේ ලිපි යවා ඇති බව. | පනත ප්‍රකාරව ආදායම් අය කර ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් නාගරික නොවන සීමාව තුළ ගොඩනැගිලි සැලසුම් හා ඉඩම් අනුබෙදුම් අනුමත කිරීමට අදාළ විධිවිධාන සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාව සකස් කිරීම සඳහා කටයුතු යොදමින් පවතින බව. | අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු අක්කර 08 රූඩ් 01 පර්චස් 11.86 ක ප්‍රමාණයකින් යුතු ඉඩම් 08 ක් හා ප්‍රමාණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවූ ඉඩම් 04 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍ර 180 ක් සභාව විසින් අනුමත කර තිබුණද අනුකූලතා සහතික ලබා ගෙන තිබුණේ 15 ක් සඳහා පමණි. | අනුකූලතා සහතික ලබා දීමේ කටයුතු විධිමත්ව සිදු කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ ක්‍රියාත්මක කර 2019 වර්ෂයේ රු. 966,588 ක බිල්පත් වටිනාකමට වැඩ අවසන් කර තිබූ දංගල සති පොළ ගොඩනැඟිල්ලේ වහල නිසි ප්‍රමිතියෙන් ඉදිකර නොතිබීම හේතු කර ගෙන වැසි ජලය කාන්දුවීමක් සිදු වන අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 1 ½ කට ආසන්න කාලයක් භාවිතයට ගෙන නොතිබුණි. | පවතින අඩුපාඩු සකස් කිරීමෙන් පසු නැවත පොළ පැවැත්වීමට කටයුතු කරන බව. | අඩුපාඩු සකස් කර භාවිතයට ගත යුතු වේ. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කොස්නිල්ගොඩ රුසියගලවේල්ල මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු.370,859 ක් වැය කර තිබූ අතර විෂය අංක 03 යටතේ පස් ඝන මීටර් 602 ක් ප්‍රවාහනය කිරීම සඳහා TI 006 රේටය වෙනුවට TI 002 රේටය භාවිතා කිරීමෙන් රු.107,210 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මිළ ගණන් විශ්ලේෂණය අනුව ට්‍රැක්ටර් රථ යොදා ගනිමින් ව්‍යාපෘතිය සිදු කරයි නම්, ඒ සඳහා , T1 -002 භාවිතා කළ හැකි බව. | නියමිත රේටයන් භාවිතා කළ යුතු වේ. |
| (ආ) | කොටපොළ ප්‍රාදේශීය සභාවට අයත් මොරවක කන්ද ජල මූලාශ්‍රයෙහි ටැංකියක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.330,000 ක අත්තිකාරම් මුදලක් කොන්ත්‍රාත්කාර සමිතියට ගෙවා තිබූ අතර 2023 අප්‍රේල් 21 දින වන විටත් ඉදිකර තිබූ කොටස්ද ජල පහරට හසු වීමෙන් විනාශ වී ගොස් තිබූ බැවින් ඉදිකිරීම් අතර මග නතර කර තිබුණි. | කොටපොළ ප්‍රාදේශිය සභාව සමඟ ගිවිසුම් ගත වී එකඟතාවයකට පැමිණ, ජල ටැංකිය ඉදි කිරීම කොටපොල ප්‍රාදේශය සභාවට පැවරීමට කටයුතු කර, අත්තිකාරම් මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | ඉදි කිරීම් කටයුතු විධිමත් පරිදි ඉටු කළ යුතු වේ. |